# "සොබා චලන සිතුවම්"කෙටි චිත්‍රපට තරඟාවලිය

2018 ජූනි 05 වන දිනට යෙදෙන ජගත් පරිසර දිනය නිමිත්තෙන් දීප ව්‍යාප්ත කෙටි චිත්‍රපට තරඟාවලියක් සංවිධානය කිරීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය තීරණය කර ඇත.

**තරඟ කොන්දේසි -**

- චිත්‍රපටයේ කාලය උපරිම විනාඩි පහක් වන අතර, පරිසරය පිළිබඳ ඕනෑම තේමාවක් ඔස්සේ නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවෙන් නිර්මාණ ඉදිරිපත් කල හැකි අතර සිංහල, දෙමළ යන භාෂාවෙන් සිදු කරන නිර්මාණ සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් උපසිරැසි ගැන්විය හැකි නම් වඩාත් සුදුසුය. (දෙබස් රහිත නම් මෙම කොන්දේසිය අදාළ නොවේ.)
- එක් අයදුම්කරුවෙකුට නිර්මාණ එකකට වැඩි සංඛ්‍යාවක් වුවද ඉදිරිපත් කළ හැකි අතර,එක් නිර්මාණයක් DVD පිටපත් දෙකකින් ලබා දිය යුතුය.
- තරඟයට ඉදිරිපත් කරන චිත්‍රපට සුදුසු අවස්ථාවන්හි ප්‍රදර්ශනය කිරීමේ සහ ප්‍රදර්ශනය සඳහා ආයතන වෙත ලබා දීමේ අයිතිය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට හිමිවේ.
- අනන්‍යතාවය තහවුරු කිරීමේදී ඇතිවිය හැකි ගැටළු මගහරවා ගැනීම සඳහා නිර්මාණකරුවන් සිය සැබෑ නමින් පමණක් නිර්මාණ ඉදිරිපත් කල යුතුය.

ඉහත තරඟයේ විනිශ්චය අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් විනිසුරු මඩුල්ලක් විසින් සිදු කරන අතර, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

තෝරා ගන්නා හොඳම නිර්මාණ සඳහා

| | |
|---|---|
| **1 වෙනි ස්ථානය** | **- රු. 50,000.00** |
| **2 වෙනි ස්ථානය** | **- රු. 35,000.00** |
| **3 වෙනි ස්ථානය** | **- රු. 25,000.00** |
| **කුසලතා සම්මාන 05** | **- රු.10,000.00** |

යනාදී ලෙස මුදල් ත්‍යාග මෙන්ම සම්මාන සහ සහතික පත්‍ර ද පිරිනැමීමට නියමිතය. සහභාගී වන සියළු තරඟකරුවන් සඳහා සහතික පත්‍රයක් ද ප්‍රදානය කෙරේ.

ඔබේ නිර්මාණ වෙබ් අඩවියෙහි ඇතුළත් කර ඇති අයදුම්පත ද සමඟ 2018/05/30 දිනට පෙර අප වෙත යොමු කරන්න.

**ලිපිනය -** අධ්‍යක්ෂ (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ),
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,
"සොබාදම් පියස",
අංක 416/C/1,රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල.